සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## AA3 විභාගය - 2019 ජූලි

## (AA35) සංස්ථාපිත සහ පුද්ගලික බදුකරණය

(Corporate and Personal Taxation)

2019-07-21
පස්වරු
[1.45 – 5.00]

පිටු ගණන : 08
ප්‍රශ්න ගණන: 09

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):
  (1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
  *උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*
  (2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***
  (3) *ඉල්ලුම් කරන ලද **මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,** ඔබ වෙත සපයන ලද **පොත්වල උත්තර** ලියන්න.*
  (4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*
  (5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර **පමණක්** භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*
  (6) *අර්ථකථන සහිත **කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව** අමුණා ඇත. සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*
  (7) *ලකුණු 100 යි.*

---

## A කොටස

අනිවාර්ය ප්‍රශ්න හතර (04) කි.

(මුළු ලකුණු 20)

### 01 වන ප්‍රශ්නය

2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතේ ප්‍රතිපාදනයන් අනුව, යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් තැනැත්තෙකුගේ බදු අයකළ හැකි ආදායම, ප්‍රධාන ආදායම් ප්‍රභවයන් හතරකින් සමන්විත වේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) දේශීය ආදායම් පනතට අනුව, ප්‍රධාන ආදායම් ප්‍රභවයන් හතර(04) **හඳුනා දක්වන්න.** (ලකුණු 02)

(b) දේශීය ආදායම් පනතේ ප්‍රතිපාදනයන්ට අනුව "බලයලත් නියෝජිතයෙකු" විය හැකි තැනැත්තන් තිදෙනෙක්(03) **සඳහන් කරන්න.** (ලකුණු 03)

(මුළු ලකුණු 05)

### 02 වන ප්‍රශ්නය

**A2Z Inc. සමාගම** නවසීලන්තය පදනම් කරගත් බහුජාතික සමාගමකි. 2017 දෙසැම්බර් 01 දින, 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ ලියාපදිංචි කරන ලද පරිපාලිත සමාගමක්, එම බහුජාතික සමාගමට, ශ්‍රී ලංකාවේ තිබේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2018/19 තක්සේරු වර්ෂය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ආදායම් බදු අරමුණු සඳහා එම පරිපාලිත සමාගමේ වාසිකභාවය (resident status) **පැහැදිලි කරන්න.** (ලකුණු 05)

## 03 වන ප්‍රශ්නය

**සීමාසහිත සරසි ෆැබ්රික්ස් (පෞද්ගලික) සමාගම,** 2019 මාර්තු මාසය තුළදී පහත දැක්වෙන ගෙවීම් සිදුකර තිබුණි:

- **සිල්වාට** (වාසික තැනැත්තෙකු) ගෙවූ සාප්පු කුලිය - රු.40,000/-.
- බදු උපදේශකයෙකු වන **රාජ්** ට (වාසික තැනැත්තෙකු) ගෙවූ උපදේශන ගාස්තුව - රු.75,000/-.
- සනිපාරක්ෂක සේවාවන් සඳහා **සීමාසහිත ජ්සි හෙල්ත් (පෞද්ගලික) සමාගමට** ගෙවූ ගාස්තුව - රු.150,000/-.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ඉහත දක්වෙන එක් එක් ගෙවීම් මත රඳවාගැනීමේ බදු [withholding tax (WHT)] අඩුකිරීමේ වගකීම **සඳහන් කරන්න**. (ලකුණු 03)

(b) 2019 මාර්තු මාසය සඳහා **සීමාසහිත සරසි ෆැබ්රික්ස් (පෞද්ගලික) සමාගම** විසින් අඩුකරන ලද මුළු රඳවාගැනීමේ බද්ද (WHT) **ගණනය කරන්න**. (ලකුණු 02)

(මුළු ලකුණු 05)

## 04 වන ප්‍රශ්නය

**පෙරේරා,** 2018/19 තක්සේරු වර්ෂය සඳහා ඔහුගේ ආදායම් බදු වගකීම රු.750,000/- ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. ඔහු පළමු සහ දෙවන වාරික සඳහා රු.300,000/- ක් ගෙවා තිබේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) තුන්වන වාරිකය ලෙස ගෙවිය යුතු ආදායම් බදු මුදල **ගණනය කරන්න**. (ලකුණු 03)

(b) තුන්වන වාරිකය ගෙවීමට නියමිත දිනය **සඳහන් කරන්න**. (ලකුණු 02)

(මුළු ලකුණු 05)

*A කොටසෙහි අවසානය*

## B කොටස

අනිවාර්ය ප්‍රශ්න තුන (03) කි.

(මුළු ලකුණු 30)

## 05 වන ප්‍රශ්නය

**PN බ්‍රදර්ස්, ප්‍රවීන්** සහ **නිසාන්** යන සහෝදරයන් දෙදෙනා විසින් ආරම්භ කළ හවුල් ව්‍යාපාරයකි. එය ලිපිද්‍රව්‍ය අයිතම තොග සහ සිල්ලර වෙළඳාමේ නිරතව සිටියි. හවුල් ගිවිසුම අනුව, ලාභ/ලාභ **ප්‍රවීන්** සහ **නිසාන්** අතර සමසමව බෙදා ගැනීමට එකඟ වී තිබේ.

2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන අනුව, හවුල් ව්‍යාපාරයේ පිරිවැටුම සහ ශුද්ධ ලාභය පිළිවෙලින් රු.54,350,000/- ක් සහ රු.12,100,000/- ක් විය.

(1) ශුද්ධ ලාභය ගණනය කිරීමේදී පහත සඳහන් වියදම් අඩුකර තිබේ:

| | රු. |
|---|---:|
| හවුල්කරුවන්ට ගෙවූ වැටුප් | 2,640,000 |
| කාර්යාල සේවක වැටුප් | 3,950,000 |
| වත්කම් මත ක්ෂය | 190,000 |

(2) ව්‍යාපාරික කටයුතුවල නියැලීම වෙනුවෙන්, **ප්‍රවීන්** සහ **නිසාන්** පිළිවෙලින් රු.120,000/- ක සහ රු.100,000/- ක මාසික වැටුප් ලබා ගනිති.

(3) 2018/19 තක්සේරු වර්ෂය සඳහා බදු අරමුණු සඳහා වත්කම් මත ප්‍රාග්ධන දීමනාව රු.175,000/- කි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

පහත සඳහන් ඒවා **ගණනය කරන්න**:

(a) 2018/19 තක්සේරු වර්ෂය සඳහා බදු අරමුණු සඳහා හවුල් ව්‍යාපාරයේ ආදායම. (ලකුණු 03)

(b) 2018/19 තක්සේරු වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරය විසින් ගෙවිය යුතු රඳවාගැනීමේ බද්ද. (ලකුණු 02)

(c) 2018/19 තක්සේරු වර්ෂය සඳහා එක් එක් හවුල්කරුවාගේ හවුල් ව්‍යාපාරයේ ආදායම් කොටස. (ලකුණු 03)

(d) 2018/19 තක්සේරු වර්ෂය සඳහා තිබෙන එක් එක් හවුල්කරුවාගේ රඳවාගැනීමේ බදු බැර. (ලකුණු 02)

(මුළු ලකුණු 10)

## 06 වන ප්‍රශ්නය

**සීමාසහිත රන්සළු එන්ටර්ප්‍රයිසස් (පෞද්ගලික) සමාගම,** අත්යන්ත්‍ර සාරි නිෂ්පාදනය කර විකිණීමේ ව්‍යාපාරයක නිරතව සිටී. එසේම, එය දේශීය සැපයුම්කරුවන්ගෙන් අත්යන්ත්‍ර ගෘහ අයිතම මිලට ගෙන ඒවා ඔවුන්ගේ ප්‍රදර්ශනාගාරවල විකිණීම ද සිදුකරනු ලබයි.

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ කාර්තුව සඳහා **සීමාසහිත රන්සළු එන්ටර්ප්‍රයිසස් (පෞද්ගලික) සමාගමේ** ගිණුම් පොත්වලින් පහත සඳහන් තොරතුරු උපුටාගන්නා ලදී:

(1) සමාගමේ විකුණුම්:

| | **රු.** |
|---|---|
| සමාගම විසින් නිෂ්පාදනය කළ අත්යන්ත්‍ර සාරි විකිණීමෙන් | 8,340,000 |
| සමාගම, දේශීයව මිලට ගත් අයිතම විකිණීමෙන් | 5,340,000 |
| **එකතුව** | **13,680,000** |

(2) පැරණි මහන මැෂිමක් විකිණීමෙන් සමාගමට රු.500,000/- ක් ලැබී තිබේ.

(3) සමාගම පහත දැක්වෙන පරිදි ජාතිය ගොඩනැගීමේ බදු [Nation Building Tax (NBT)] ගෙවා තිබේ:

| | **රු.** |
|---|---|
| නිෂ්පාදන ක්‍රියාවලියේදී භාවිත කරන ආනයනික අමුද්‍රව්‍ය මත | 126,000 |
| දේශීයව මිලට ගත් ගෘහ අයිතම මත | 65,000 |

(4) 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ කාර්තුව සඳහා ජාතිය ගොඩනැගීමේ බදු මාසික වාරික වශයෙන් රු.50,000/- ක් ගෙවා තිබේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ කාර්තුව සඳහා ඉතිරි ගෙවිය යුතු ජාතිය ගොඩනැගීමේ බද්ද **තක්සේරු කරන්න**. (ලකුණු 06)

(b) 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ කාර්තුව සඳහා ජාතිය ගොඩනැගීමේ බදු වාර්තාව ඉදිරිපත් කිරීමට නියමිත දිනය **සඳහන් කරන්න**. (ලකුණු 01)

(c) 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ කාර්තුව සඳහා ගෙවිය යුතු ආර්ථික සේවා ගාස්තුව [Economic Service Charge (ESC)] **තක්සේරු කරන්න**. (ලකුණු 03)

(මුළු ලකුණු 10)

## 07 වන ප්‍රශ්නය

**සීමාසහිත සමතල ක්‍රියේෂන්ස් (පෞද්ගලික) සමාගම,** දේශීය සහ විදේශීය ගනුදෙනුකරුවන් සඳහා ගමන්මළු නිෂ්පාදන ව්‍යාපාරයේ නිරත, එකතුකළ අගය මත බදු [Value Added Tax (VAT)] සඳහා ලියාපදිංචි සමාගමකි. පහත සඳහන් තොරතුරු 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ කාර්තුව සඳහා සමාගමේ පොත්වලින් උපුටාගන්නා ලදී:

(1) විකුණුම් පිළිබඳ විස්තර (එකතුකළ අගය මත බදු රහිතව):

| | රු. |
|---|---|
| දේශීය වෙළෙඳපොළේ විකුණුම් | 6,084,000 |
| අපනයනකරුවන්ට කළ විකුණුම් - SVAT ක්‍රමය යටතේ | 1,716,000 |
| | **7,800,000** |

(2) කාර්තුව තුළදී සමාගම, පහත සඳහන් යෙදවුම් බදු (input VAT) ගෙවා තිබේ:

| | රු. |
|---|---|
| අමුද්‍රව්‍ය මිලදී ගැනුම් මත | 843,000 |
| ප්‍රධාන විධායක නිලධාරී විසින් පාවිච්චි කරන මෝටර් කාර් රථයට කළ අළුත්වැඩියා මත | 24,000 |
| | **867,000** |

(3) සමාගම, කාල පරිච්ඡේදයට අදාළ වන රු.257,400/- ක් වන සියලුම සරල කරන ලද එකතු කළ අගය මත බදු (SVAT) බැර වවුචර්පත් එකතු කරගෙන තිබේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ කාර්තුව සඳහා ඉතිරි ගෙවිය යුතු / (වැඩිපුර ගෙවූ) එකතු කළ අගය මත බද්ද (VAT) **තක්සේරු කරන්න**. (ලකුණු 07)

(b) එකතුකළ අගය මත බදු පනතට අනුව, බදු ඉන්වොයිසියක ඇතුලත් විය යුතු කරුණු තුනක්(03) **සඳහන් කරන්න**.
(ලකුණු 03)
(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

## C කොටස

අනිවාර්ය ප්‍රශ්න දෙක (02) කි.

(මුළු ලකුණු 50)

### 08 වන ප්‍රශ්නය

**සීමාසහිත සහස්‍රා ඉන්ටනැෂනල් (පෞද්ගලික) සමාගම**, 2016 අප්‍රේල් 01 දින සමාගම් පනත යටතේ සංස්ථාපනය කරන ලද අතර, එදිනම එහි මෙහෙයුම් කටයුතු ආරම්භ කරන ලදි. එය ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයනය කර දේශීය වෙළෙඳපොලේ විකිණීමේ ව්‍යාපාරයක නිරතව සිටී. පහත සඳහන් තොරතුරු 2019 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා **සීමාසහිත සහස්‍රා ඉන්ටනැෂනල් (පෞද්ගලික) සමාගමේ** මූල්‍ය ප්‍රකාශනවලින් උපුටාගන්නා ලදි:

(1) 2019 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සාරාංශගත ආදායම් ප්‍රකාශනය පහත දැක්වේ:

| | **රු.** |
|---|---|
| පිරිවැටුම | 565,750,000 |
| විකුණුම් පිරිවැය | (339,450,000) |
| **දළ ලාභය** | **226,300,000** |
| වෙනත් ආදායම්: | |
| ස්ථාවර තැන්පතු මත පොලී ආදායම - දළ | 350,000 |
| ලද ලාභාංශ - ශුද්ධ | 122,980 |
| බෙදාහැරීමේ වෑන් රථය විකිණීමේ ලාභය | 84,000 |
| | 226,856,980 |
| පරිපාලන වියදම් | (114,500,000) |
| බෙදාහැරීමේ වියදම් | (43,650,000) |
| මූල්‍ය වියදම් | (4,350,000) |
| **ආදායම් බදුවලට පෙර ලාභය** | **64,356,980** |

(2) පරිපාලන වියදම්වල පහත සඳහන් දෑ ඇතුළත් වේ:

- වර්ෂය සඳහා ක්ෂය අයකිරීම රු.4,876,000/- කි.
- වර්ෂය සඳහා පාරිතෝෂික වෙන්කිරීම රු.764,000/- ක් වන අතර, වර්ෂය තුළදී පාරිතෝෂික ගෙවීම් කිසිවක් සිදුකර නොතිබුණි.
- සමාගම, අපි වෙනුවෙන් අපි අරමුදලට රු.1,000,000/- ක් පරිත්‍යාග කර තිබේ.
- වෙළෙඳ බලපත්‍රය අලුත් කිරීම ප්‍රමාද වීම නිසා රු.53,500/- ක දඩයක් ප්‍රාදේශීය සභාවට ගෙවා තිබේ.
- ප්‍රධාන විධායක නිලධාරී සහ ඔහුගේ පවුල සතුටු කිරීම වෙනුවෙන් වූ විදේශ සංචාරයක් සඳහා සමාගම රු.800,000/- ක් දරා තිබේ.

(3) බෙදාහැරීමේ වියදම්වල පහත සඳහන් දෑ ඇතුළත් වේ:

- සංග්‍රහ වියදම් රු.225,000/- ක් වූ අතර, ව්‍යාපාර ගනුදෙනු සඳහා පැමිණි ගනුදෙනුකරුවන්ව සතුටු කිරීම වෙනුවෙන් එය දරණ ලදි.
- දේශීය මාධ්‍යයන්හි ප්‍රචාරණ දැන්වීම් වෙනුවෙන් රු.675,000/- ක් දරණ ලද අතර, ගණකාධිකාරීවරයෙකු බඳවා ගැනීම වෙනුවෙන් පුවත්පත් දැන්වීමක් සඳහා රු.50,000/- ක් දරණ ලදි.
- සමාගම, වෙළෙඳ ණයගැතියෙකුගෙන් ලැබිය යුතු රු.250,000/- ක් ඔහු බංකොලොත් වීම නිසා ලියාහරින ලද අතර, ඉතිරි ණයගැතියන්ගෙන් අඩමාණ ණය වශයෙන් රු.500,000/- ක පොදු වෙන්කිරීමක් ද සිදුකර තිබුණි.

(4) දේපළ, පිරියත සහ උපකරණ පිළිබඳ විස්තර පහත දැක්වේ:

**පිරිවැය**

| වත්කම් | 2018 අප්‍රේල් 01 දිනට ශේෂය (රු.) | එකතු කිරීම් (රු.) | ඉවත්කිරීම් (රු.) | 2019 මාර්තු 31 දිනට ශේෂය (රු.) |
|---|---|---|---|---|
| යන්ත්‍රෝපකරණ | 2,475,000 | 1,200,000 | - | 3,675,000 |
| මෝටර් වාහන | 5,675,000 | 4,000,000 | 2,400,000 | 7,275,000 |
| කාර්යාල උපකරණ | 477,000 | - | - | 477,000 |
| පරිගණක | 265,000 | 435,000 | - | 700,000 |
| **එකතුව** | **8,892,000** | **5,635,000** | **2,400,000** | **12,127,000** |

- 2019 ජනවාරි 01 දින බෙදාහැරීමේ වෑන් රථයක් රු.1,200,000/- කට විකුණන ලදී. විකුණන ලද වාහනය ප්‍රතිස්ථාපනය කිරීම සඳහා සමාගම, රු.4,000,000/- කට නව ලොරි රථයක් 2019 ජනවාරි 10 දින මිලදී ගන්නා ලදී.
- ඉතිරි මෝටර් වාහන, ප්‍රධාන විධායක නිලධාරී භාවිත කරනු ලබන කාර් රථය නිරූපණය වේ.
- 2018 අප්‍රේල් 01 දිනට පැවති සියලු වත්කම් සමාගම සංස්ථාපනය කරන ලද අවස්ථාවේදී මිලට ගෙන තිබේ.

(5) සමාගමට 2017/18 තක්සේරු වර්ෂයෙන් ඉදිරියට ගෙන එන ලද ව්‍යාපාරයෙන් ලද රු.5,678,000/- ක බදු අලාභයක් තිබේ.

(6) 2018/19 තක්සේරු වර්ෂය සඳහා ආර්ථික සේවා ගාස්තු [Economic Service Charge (ESC)] ගෙවීම් රු.2,828,750/- කි.

(7) සමාගම, 2018/19 තක්සේරු වර්ෂය සඳහා කාර්තුමය ආදායම් බදු වාරික වශයෙන් රු.8,000,000/- ක් ගෙවා තිබේ.

(8) බැංකුව විසින් ස්ථාවර තැන්පතු පොලිය මත අදාල අනුපාතය යටතේ රඳවා ගැනීමේ බදු (WHT) අඩුකර තිබේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2018/19 තක්සේරු වර්ෂය සඳහා පහත සඳහන් දෑ **තක්සේරු කරන්න**:

(a) තක්සේරු කළ හැකි ආදායම,

(b) බදු අයකළ හැකි ආදායම,

(c) ගෙවිය යුතු දළ ආදායම් බද්ද, සහ,

(d) ගෙවිය යුතු ඉතිරි බද්ද.

***සැ.යු:*** *යම් වියදමක් ඉඩ දීමට හෝ ඉඩ නොදීමට හේතු පැහැදිලිව සඳහන් කළ යුතුයි.* (ලකුණු 25)

## 09 වන ප්‍රශ්නය

**සරලා මහත්මිය** වෘත්තියෙන් නීතිඥවරියක වන අතර, ප්‍රමුඛ පෙළේ බැංකුවක නීති නිලධාරිනියක් ලෙස සේවය කරයි. 2018/19 තක්සේරු වර්ෂය (මින්මතු 'වර්ෂය' යැයි හැඳින්වෙන) සඳහා **සරලා මහත්මිය** සම්බන්ධව පහත සඳහන් තොරතුරු සපයා ඇත:

(1) වර්ෂය තුළදී ඇයට බැංකුවෙන් පහත සඳහන් දෑ ලැබී තිබේ:

- දළ වැටුප - මසකට රු.200,000/- ක් බැගින්.
- ප්‍රවාහන දීමනාව - මසකට රු.35,000/- ක් බැගින්.
- 2018 දෙසැම්බර් මාසයේදී ලැබුණු එක් මාසයක ප්‍රසාද දීමනාව - රු.200,000/-.
- ඇය වාසය කරන්නේ සේවායෝජක විසින් සපයන ලද කුලී රහිත නිවසකයි. සේවායෝජකයා විසින් රු.50,000/- ක මාසික කුලියක් අයිතිකරුට ගෙවා තිබේ. නිවසේ වරිපනම් තක්සේරුව රු.1,200,000/- කි.
- වර්ෂය සඳහා රු.64,000/- ක් වන ඇගේ දුරකතන බිල්පත්, බැංකුව විසින් ප්‍රතිපූරණය කර තිබේ.
- බැංකුවේ ඇයගේ 10 වන සේවා සංවත්සරය වෙනුවෙන් රු.100,000/- ක ත්‍යාගයක් ඇයට ලැබුණි.
- සේවක අර්ථසාධක අරමුදලට (EPF) සහ සේවක භාරකාර අරමුදලට (ETF) සේවායෝජකගේ දායකත්වය පිළිවෙලින් දළ වැටුපෙන් 12% ක් සහ 3% ක් විය.

(2) වර්ෂය තුළදී **සරලා මහත්මියට** පහත සඳහන් පොලී ආදායම් ලැබී තිබේ:

- ස්ථාවර තැන්පතුවක් මත - රු.243,750/- (රඳවා ගැනීමේ බදු අඩුකළ පසු).
- යහළුවෙකුට දුන් ණය මුදලක් මත - රු.100,000/-.

(3) **සරලා මහත්මියට** වරිපනම් තක්සේරුව රු.250,000/- ක් වන නිවසක් රත්නපුර ප්‍රදේශයේ තිබේ. මෙම නිවස මාසයකට රු.45,000/- බැගින් කුලියට දී තිබේ. 25% බැගින් වරිපනම් ගෙවා ඇත.

(4) ඇය, කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත සමාගම් කීපයක කොටස්වල ආයෝජනය කර තිබේ. වර්ෂය තුළදී ඇයට රු.43,000/- ක ශුද්ධ ලාභාංශ ආදායමක් ලැබී තිබේ.

(5) වර්ෂය තුළදී ඇය රු.100,000/- ක් වටිනා භාණ්ඩ, ගංවතුරින් විපතට පත්වූවන්ට බෙදා දීම සඳහා ආපදා කළමනාකරණ අමාත්‍යාංශයට පරිත්‍යාග කර තිබේ.

(6) **සරලා මහත්මිය,** 2018/19 තක්සේරු වර්ෂය සඳහා කාර්තුමය ආදායම් බදු වාරික වශයෙන් රු.50,000/- ක් ගෙවා තිබේ.

(7) වර්ෂය සඳහා අඩුකළ උපයනවිට ගෙවීමේ බද්ද (PAYE) රු.190,720/- කි.

ඉහත සඳහන් තොරතුරු ඇසුරෙන්,

**ඔබ විසින් කළ යුතු දෑ:**

2018/19 තක්සේරු වර්ෂය සඳහා **සරලා මහත්මියගේ** පහත සඳහන් දෑ **තක්සේරු කරන්න:**

(a) බදු අයකළ හැකි ආදායම,

(b) ගෙවිය යුතු දළ ආදායම් බද්ද,

(c) ගෙවිය යුතු ඉතිරි ආදායම් බද්ද, සහ,

(d) බදු නිදහස් ආදායම (වේ නම්). (ලකුණු 25)

*C කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 01 මට්ටම<br>**අවබෝධය**<br>වැදගත් තොරතුරු ආවර්ජනය සහ පැහැදිලි කිරීම. | **නිර්වචනය කරන්න** | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |
| | **අඳින්න** | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | **හඳුනා දක්වන්න** | යමක් මනා සැලකිලිමත් වීමකින් අනතුරුව හඳුනා ගැනීම හෝ තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | **ලැයිස්තුගත කරන්න** | විස්තර කිරීමකින් තොරව අදාල කරුණු එකින් එක වචනයෙන් ලියා දැක්වීම. |
| | **සම්බන්ධ කරන්න** | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාවය පෙන්නුම් කිරීම හෝ තහවුරු කිරීම. |
| | **සඳහන් කරන්න** | යමක් ස්ථිර ලෙස පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | **ගණනය කරන්න** | ගණිතමය ගණනය කිරීම. |
| | **විමසන්න** | අවසන් නිගමනයකට පිවිසීම සඳහා විවිධ පැතිකඩ තර්කානුකූලව සවිස්තරව පරීක්ෂා කිරීම. |
| | **පැහැදිලි කරන්න** | අදාල කරුණු සවිස්තරාත්මකව දැක්වීම. |
| | **අර්ථකතනය කරන්න** | අවබෝධයට පහසු සුපුරුදු පද මගින් අර්ථය ඉදිරිපත් කිරීම. |
| | **හඳුනාගන්න** | සෙවීමෙන් හෝ ප්‍රයත්න දැරීමෙන් නිගමනයකට එළඹීම. |
| | **සටහන් කරන්න** | අදාල කරුණු විස්තරාත්මකව සටහන් කිරීම. |
| | **සාරාංශගත කරන්න** | කරුණු වශයෙන් හෝ සංඛ්‍යා වශයෙන් ප්‍රධාන කරුණු කෙටියෙන් දැක්වීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 02 මට්ටම<br>**භාවිතය**<br>ඉගෙනගත් පසුබිම නොවන පසුබිමක දැනුම භාවිත කිරීම / සංවෘත ගැටළු විසඳීම. | **භාවිත කරන්න** | ප්‍රායෝගිකව භාවිතයේ යොදන්න. |
| | **තක්සේරු කරන්න** | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | **ප්‍රදර්ශනය කරන්න** | සුවිශේෂී ලෙස උදාහරණ සමග ඔප්පු කරන්න. |
| | **ප්‍රස්තාර දක්වන්න** | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | **පිළියෙල කරන්න** | දී ඇති විස්තර සැලැස්මකට ගොනු කිරීම. |
| | **ප්‍රමුඛතා දක්වන්න** | වැදගත්කම, අනුපිළිවෙල අනුව දක්වන්න. |
| | **සසඳන්න** | තවත් දෙයක් සමග සංගත වේදැයි බැලීම. |
| | **විසඳන්න** | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 03 මට්ටම<br>**විශ්ලේෂණය**<br>අදහස් අතර සම්බන්ධතා ගොඩනගා සමාන අසමානතා බැලීම / විවෘත ගැටළු විසඳීම. | **විශ්ලේෂණය කරන්න** | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |
| | **සමානකම් බලන්න** | සමානකම් සොයා ගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **අසමානතා බලන්න** | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **වෙනස්කොට දක්වන්න** | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දැ හඳුනා ගැනීම. |
| | **සැකිල්ලක් සේ දක්වන්න** | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |